දිවි තොර කරගැනීම් වාර්තා කිරීමේදී මාධ්‍ය විසින් ඒ සඳහා හඳුන්වා දී ඇති මාධ්‍ය මාර්ගෝපදේශයන් අනුගමනය කළ යුත්තේ, දිවි තොර කරගැනීම් වසංගතයක් ලෙසින් පැතිර යෑමේ හැකියාවක් ඇති බැවිනි. එසේම, ඝාතන-දිවි තොර කරගැනීමේ සිදුවීමකට බොහෝ විට වෙනත් දිවි තොර කරගැනීමේ සිදුවීමකට වඩා ඉහළ අවධානයක් ලැබෙනා බැවින්, ඝාතන-දිවි තොර කරගැනීම් වාර්තා කිරීමේදී ද මාධ්‍ය වඩාත් ප්‍රවේසම් සහගත හා ආචාර ධාර්මික විය යුතු වේ.

මැයි 10, 2022 මව්බිම පුවත්පතේ එකම පිටුවක දක්වා තිබූ එකිනෙකට වෙනස් දිවි තොර කරගැනීමේ සිදුවීම් තුනක් මේ සම්බන්ධයෙන් නිදසුන් ලෙසින් දැක්විය හැක.

1) මෙහිදී දිවි තොර කරගත් ආකාරය හෙළි නොකිරීම ඔස්සේ, අනුකාරක දිවි තොර කර ගැනීම් වැළැක්වීමට පිටුවහලක් වනු ඇත.

2) එසේම, මෙවැනි පුවත් සමගින් හදිසි උපකාරක අංක සඳහන් කිරීම ඔස්සේ, දිවි තොර කරගැනීමේ නැඹුරුතාවක් ඇති තවත් අයගේ ජීවිත බේරාගැනීමේ අවකාශයක් නිර්මාණය කිරීමේ හැකියාවක් ද ලැබෙනු ඇත.

ඒ අනුව, දිවි තොර කරගැනීම් වාර්තා කිරීම පිළිබඳ මාර්ගෝපදේශයන්ට අනුකූලව සහ වඩාත් ප්‍රවේසම් සහගතව මෙම පුවත වාර්තා කිරීම සඳහා විකල්ප ආකාරයක් නොමැත්තේ ද? ඔබේ අදහස?

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926
මූලාශ්‍ර:
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...
https://media.samaritans.org/.../Media_Guidelines_FINAL.pdf